# ප්‍රතිපත්ති ගරුක ඔහු



සනත්-මල්කාන්ති නන්දසිරි යුවල මුල් වතාවට බ්‍රිස්බේන් එන ආරංචිය අපේ කණ වැකුණෙ නීලා වික්‍රමසිංහ ගායිකාව බ්‍රිස්බේන්හි පැවැත්වූ සංගීත ප්‍රසංගයට සහභාගීවූ අවස්ථා-වේදීයි. 'අපේ ගෙදර නතර වෙන්න පුළුවන්' කියලා මගෙ චූටි නංගිත් එයාගෙ මහත්තයත් කැමැත්තෙන්ම ඒ වගකීම බාර ගත්තෙ සනත් අංකලුත් මල්කාන්ති ආන්ටිත් අපේ පවුලේ සමීපතම අයවලුන් හින්දයි. ඒ සමීපකම අද ඊයේ ඇති වුණාවත්, ඔවුන්ගෙ ජනප්‍රියත්වය, ප්‍රසිද්ධිය හින්දා ඇති වුණාවත් නෙවෙයි. හැටේ දශකයේ මගේ අම්මත්, සනත් අංකලුත් අම්පාර ප්‍රදේශයේ ගුරුවරුන් ලෙස සේවය කරන කාලයේ ඇතිවූවක්. ඒ අම්මගෙ ගුරු සේවයේ දුෂ්කර කාල පරිච්ඡේදය වගේම සනත් අංකල්ගෙ ඉන්දියාවේ අධ්‍යාපනය නිමා කිරීමෙන් පසුව ගුරුවරයෙකු ලෙස ලංකාවේ ලද පළමු පත්වීම. කොහොම නමුත් අගෝස්තු 27 වෙනිදා සනත් අංකලුත් මල්කාන්ති ඇන්ටිත් මෙහේ ආවා. ගුවන් තොටුපලේ සිටම ආන්ටිගෙ උපන් දිනය වෙනුවෙන් සු'පැතුම් බොහෝමයක් ලැබුණා. වෙනදට සති අන්තයේදී එක ගෙදරකට එකතු වෙන අපේ පවුලෙ හැමෝම සනත් අංකලුත් ආන්ටිත් මෙහෙ ගත කළ සතිය පුරාම කොයි තරම් කායිබහුල බවක් මැද්දෙ හරි චූටි නංගිගෙ ගෙදරට එකතු වුණේ පහුගිය තොරතුරු වගේම අංකල්ගෙ කතා රස විඳින්න. විශේෂයෙන්ම අංකල්ගෙ කතාවල් මැද්දෙ රෑ ගෙවෙද්දි පාන්දර එක දෙක වෙනවා අපට දැනුණෙ නෑ.

කාලෙකින් පත්තරේට දායක වෙන්න බැරිවුණ මට හිතුණා සාමාන්‍ය ජනතාව වන අපි හුග දෙනෙක් නොදන්න සනත් නන්දසිරි මල්කාන්ති යුවළ ගැනත් කලා ලෝකේ රස කතා ටිකකුත් මේ ලිපියට ඇතුළත් කරන්න. මේ දේවල් කියවද්දි කිසිම විටෙක අපි නොදැන හිටි විස්තර නේද කියලා ඔබටත් හිතේවි.

සාමාන්‍ය ජීවිතේදි සනත් අංකල් හොඳ විහිළු කාරයෙක්. ඒ විහිළු කතා වලට අපි කොයි තරම් හිනා වුණත්, අංකල් ඒ වලට හිනා වෙන්නෙ නෑ. ඒ වගේම තමයි මල්කාන්ති ආන්ටි කීකරු බිරිඳක්. ඒ රඟපෑමක් නෙවෙයි. අපිත් දැන හිටි දෙයක්. නමුත් ඒ දෙන්නම සාමාන්‍ය ජනතාව ඉදිරියේ හරි නිහතමානීයි. සාමාන්‍ය ජනතාව කියනෙකෙන් මං අදහස් කලේ අපි හැමෝම ප්‍රසිද්ධ පුද්ගලයො නෙවෙයිනෙ, ඒකයි. නමුත් සනත් අංකල්ගෙත් මල්කාන්ති ආන්ටිගෙත් නිහතමානීත්වය ගැන නොදන්න කිහිප දෙනෙක් ප්‍රසංගයට කලින් එකිනෙකාගෙන් අහල තිබුණෙ 'සනත් නන්දසිරි මහ ආඩම්බර කාරයෙක්ලු' නේද ? කියලයි. හැබැයි සැබෑ ජීවිතයේදි ඔහු සමග කතා කළ, ඇසුරු කළ කිසිම කෙනෙක් ඔහු ගැන කවදාවත් එහෙම නිගමනයකට එළඹෙන්නෙ නැහැ.

අනූව දශකය මුලදී චූටි නංගිගෙ විවාහයට සාක්ෂි කරුවන් වශයෙන් ඔවුන් අත්සන් කළ බවවත් මල්කාන්ති ආන්ටිට මතක නැති වුණාට අංකල්ට හොඳට මතකයි. ආන්ටිගෙ මතකය ගැන විහිළුවෙන්ම අංකල් කිව්වෙ 'මල්කාන්කති බැඳපු බවවත් එයාට මතක නෑ' කියලයි.

මල්කාන්කති ආන්ටි ගැන හුග දෙනෙක් නොදන්න දෙයක් තමයි ඇයට අංක විද්‍යාව අනුව කෙනෙකුගෙ චරිත, ගති ලක්ෂණ ගැන කියන්නට හැකියාවක් තිබීම. ඕනෑම කෙනෙකුගේ උපන් දිනය අනුව ඇය හෝ ඔහු කොයි වගේ චරිතයක්ද කියනෙක ඇය නිවැරදිව කියනවා. ඇය කියූ ගති ලක්ෂණ අනුව ඇගේ කියමන සියයට සියයක්ම නිවැරදි බව මල්කාන්කති ආන්ටිත්තෙක්ක ඒ ගැන කතා කළ බොහෝ අය කිව්වා.

එච්. ආර්. ජෝතිපාල ගායකයාණන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් තිබුණු, චතුර කථිකත්වයක් තිබුණු කෙනෙක් කියලා අපි දැනගත්තෙ සනත් අංකල් ඔහු ගැන කතා කරද්දියි. මත් පැන් වලට කොයි තරම් ලොබ බැඳි පුද්ගලයෙකු වුණත් ජෝතිපාලයන්ට සනත් අංකල් 'ඔය ඇති' කියූ පමණින් බීම වීදුරුව පසෙකින් තබන බව මෙන්ම සැබෑ මනුෂ්‍යකම් වලින් පිරිපුන් ජෝතිපාලයන් ගැන කතා කරද්දි සනත් අංකල්ගේ ඇස් වලින් ගලා ගිය කඳුළුත්, සිහින් ඉකිබිඳුමත් ඔවුන් අතර තිබූ අපූරු සහෝදරත්වයක් ගැන අපට කියා දුන්නා.

එමෙන්ම ජෝතිපාලයන් සංගීත සංදර්ශණයකට සහභාගි වී ආපසු කොළඹ එන අතරේදී දිනෙක එම වාහනයේ සනත් අංකලුත්, මල්කාන්ති ආන්ටිත්, ජෝතිපාලයන්ගේ රියදුරුත් ගමන් ගත්තාලු. වෙලාව පාන්දර දෙකට පමණ සීදුව පොලිස් මුරපොළේදී ඔවුන් ගමන් ගත් වාහනය නතර කළ පොලිස් නිලධාරියෙක් රියැදුරුගේ බලපත්‍රය පරීක්ෂා කරන අතරම 'වාහනයේ කවුද ඉන්නේ ?' යි ඇසුවාලු. ජෝතිපාලයන් පසු පස අසුනේ නිදා සිටි නිසා රියැදුරු 'ජෝතිපාල මහත්තයා සර්' යැයි පොලිස් නිලධාරියාට කිව්වලු. 'ජෝතිපාල, කවුද ජෝතිපාල?' පොලිස් නිලධාරියා ආපිට ප්‍රශ්ණ කරන අතරේ රියුදුරු නැවතත් 'ජෝතිපාල මහත්තයා සර්' කිව්වලු. නිලධාරියාගේත් රියදුරුගේත් සංවාදය අසා සිටි ජෝතිපාලයන් අසුනේ මදක් හරි බරි ගැසෙමින් 'රාළහාමිගෙ මාසික පඩිය කීයදැ'යි ඇසුවේලු. 'මගේ පඩිය තමුන්ට මොකටදැ'යි ඇසූ සැණින් 'ලබන මාසෙ පඩියෙන් රේඩියෝවක් ගන්න, එතකොට ජෝතිපාල කවුදැ'යි හරියටම දැනගන්න පුළුවන් යැයි ජෝතිපාල කීවේලු.

'දුලීකා' චිත්‍රපටයේ පසුබිම් ගායනය සහ චිත්‍රපටයේ ඇතුළත් ගීත ගායනය කර තිබුණේ ජෝතිපාලයන් සහ සනත් අංකලුයි. 'සීත රැයාමේ අඳුරේ - වාසනා නිල් දෑස පායා' ගීතය සනත් අංකලුත් 'ආදර මල් පවනේ - ඈ යන මේ ගමනේ' ගීතය සඳහා ජෝතිපාලයනුත් ගායනයෙන් දායක වී තිබුණා. ඒ කාලයේ පැවැත්වූ එක්තරා සම්මාන උළෙලකදී සනත් අංකල්ට 'දුලීකා' චිත්‍රපටයේ ඔහු ගැයූ ගීතය වෙනුවෙන් හොඳම ගායනයට හිමි සම්මානය හිමිවන බව පවසමින් එක්තරා ආයතනයකින් ආරාධනා පත්‍රයක් ලැබුනේලු. ඔවුන් දෙපළ සම්මාන රාත්‍රියට සහභාගි වී සිටියදී හොඳම ගායනයට හිමි සම්මානය එම චිත්‍රපටයේ ජෝතිපාලයන්ට ලැබුණාලු. අඳුරේම සම්මාන රාත්‍රියට සහභාගි වූ ඔවුන් කාටත් නොදන්වා අඳුරේම නැවත නිවසට ආවාලු. ප්‍රසංගය අතරතුර අහන්නට ලැබුණු ඒ කතාව ගැන අංකල් කිව්වෙ 'සීත රෑ යාමේ' සින්දුව ගැන අංකල් කිව්වෙ සම්මානයක් හිමිවිය යුතුව තිබූ එහෙත් ඇගයීමට ලක් නොවූ ගීතයක් කියලයි.

*සනත් - මල්කාන්ති යුවළගෙ 'සීත රෑ යාමේ ප්‍රසංගය පැවැත්වුණොත් හරිම ආනන්දනීය විදියටයි. ප්‍රසංගය පැවැත්වෙන අතර තුර ගීතවල නිර්මාණත්වයට පසුබිම් වුණු අතීත කතාවන් මෙන්ම ඊට ඈඳා ගත් විහිළුවලින්ද ප්‍රේක්ෂකයන් නොමඳ සතුටක් ලැබූ බවත් මෙහිදී නොලියාම බැහැ.*

සනත් - මල්කාන්ති යුවළගේ 'සීත රෑ යාමේ ප්‍රසංගය පැවැත්වුණොත් හරිම ආනන්දනීය විදියටයි. ප්‍රසංගය පැවැත්වෙන අතර තුර ගීතවල නිර්මාණත්වයට පසුබිම් වුණු අතීත කතාවන් මෙන්ම ඊට ඈඳා ගත් විහිළුවලින්ද ප්‍රේක්ෂකයන් නොමඳ සතුටක් ලැබූ බවත් මෙහිදී නොලියාම බැහැ. ප්‍රසංගය අවසානයේදී ඒ බව සනත් අංකල්ටත් මල්කාන්ති ආන්ටිටත් පවසන්නට තරමටම ප්‍රේක්ෂකයන්ද නිහතමානී වීමත් ඇත්තටම සතුටක්. තමන් සහභාගි වූ වටිනාම, ආනන්දජනක ප්‍රසංගය 'සීත රෑ යාමේ' බව ඔවුන් ප්‍රකාශ කළා. ඒ වගේම සනත් නන්දසිරි වැනි ප්‍රබුද්ධයෙකුගෙන් පැසසුම් ලබන්නට තරම් 'බ්‍රිස්ලන්කන්' සංගීත කණ්ඩායමද වාසනාවන්ත වුණා. දහසකුත් එකක් රාජකාරි මැද ඉගෙනීම් කටයුතු මැද පූණ් කැපවීමකින් පුහුණු වූ ඔවුන්ගේ සැබෑ දක්ෂකම් ගැන ප්‍රශංසා කරන්නටත් සනත් අංකල් අමතක කළේ නැහැ.

පෙනුමින් සනත් අංකල් තවමත් අපි අවුරුදු ගණනකට කලින් දැක තිබූ ඔහුමයි. කටහඬද කිසිම වෙනසක් නැහැ. කලා ලෝකයේ අනන්ත අප්‍රමාණ හැල හැප්පීම් මැද, කට කතාවල් මැද ජීවත් වෙන අපේ කලාකරුවන්ගේ පවුල් ජීවිත බිඳ වැටෙන තරම අවුල් වෙන තරම, එකිනෙකාගේ මඩ ප්‍රහාරයන් ගැන සනත් අංකල් සමග කතා කළ අපි මේ හැම දෙයක්ම හමුවේ කිසිම කටකතාවක් නොහැදී අංකල් දුන්නේ හරිම සරල, පැහැදිලි පිළිතුරක්. 'පුතේ මල්කාන්ති කුමාරිකාවක් නෙවෙයි, ඒත් මම ප්‍රතිපත්ති ගරුක මිනිහෙක්'. ඔහුගේ ඒ ප්‍රකාශය සෘජුය. එතැනින් එහාට ඒ ගැන කතා කරන්න දෙයක් අපට ඉතුරු වුණේ නැහැ.

ඔවුන්ගේ ඕස්ට්‍රේලියා සංචාරයට සුභපැතුම් !

**මේනකා ජයතිලක**
ක්වීන්ස්ලන්තය


නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම
සවස 6 සිට 8 දක්වා
FM 88.6

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila